# ආර්ථික හා සමාජ පිරිවැය

**බලශක්තිය**

1991 වර්ෂයෙහිදී විදුලියබලය සඳහා වූ ඉල්ලුම තවදුරටත් පුළුල් වෙමින් පැවතුණි. ලංකා විදුලිබල මණ්ඩලය මෙම ඉල්ලුම සපුරාලීමට සමත් වුවද, ඇතැම් ජලාශයන්හි ජලමට්ටම අඩුවීම හේතුවෙන් වර්ෂය තුළ තාප විදුලිය බල උත්පාදනය ද වැඩිවිය. මේ අතර, ඩීසල් සහ භූමිතෙල් වල දේශීය පරිභෝජනය එම නිෂ්පාදනයන්හි සාපේක්ෂ මිල වාසිය නිසා තවදුරටත් ඉහළ නැගුණි. තවද ලංකා විදුලිබල මණ්ඩලය විසින් තාප විදුලි බලාගාර ක්‍රියා කිරීම සඳහා බැරඩීසල් උපයෝගී කර ගැනීම හේතුකොටගෙන 1991 වර්ෂයේ බැරඩීසල් ඉල්ලුම තවදුරටත් ඉහළ ගියේය. කෙසේ වුවද, වර්ෂය තුළදී පැවති ඉහළ මිල ගණන්වල බලපෑම නිසා පෙට්‍රල් සඳහා වූ ඉල්ලුම 1991 වර්ෂයේදී සියයට 11 කින් අඩුවිය.

1991 වර්ෂයේදී දර, කෘෂිකාර්මික අපද්‍රව්‍ය, සත්ව අපද්‍රව්‍ය සහ වෙනත් ශාඛ අපද්‍රව්‍ය වලින් සමන්විත වාණිජ නොවන බලශක්ති මූලාශ්‍රය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම බලශක්ති මූලාශ්‍රය වශයෙන් තවදුරටත් පැවතුණි. ඛනිජ තෙල් ටොන් සමක (ඛ.ටො.ස.) දශලක්ෂ 4.8ක් ලෙස ඇස්තමේන්තු කර ඇති මෙම බලශක්ති මූලාශ්‍රය දිවයිනේ මුළු බලශක්ති සැපයුමෙන් සියයට 71 ක් නියෝජනය කළ අතර, ඛනිජතෙල්, විදුලිය බලය, ද්‍රවඛනිජ වායුව සහ ගල් අඟුරු හා ලිග්නයිට් සුළු ප්‍රමාණයකින් ඉතිරිය සමන්විත විය.

සලකා බලන වර්ෂය තුළ, මුළු විදුලිය බල උත්පාදන ධාරිතාව මෙගවොට් 1,290ක් ලෙස නොවෙනස්ව පැවතිණි. ජල විදුලිය ස්ථාපිත ධාරිතාව මෙගවොට් 1,017ක් වූ අතර තාප බල ස්ථාපිත ධාරිතාව ද මෙගවොට් 272ක් ලෙස නොවෙනස්ව පැවතිණි. මේ අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 1991 වර්ෂයේ උත්පාදනය කරන ලද මුළු විදුලියබල ප්‍රමාණය කිලෝවොට් පැය දශ ලක්ෂ 3,377 ක් වූ අතර, එය සියයට 7ක වැඩිවීමකි. කෙසේ වුවද, ජලාශවල ජලමට්ටම අඩුවීම හේතුකොටගෙන උත්පාදනය කරන ලද මුළු ජල විදුලියබල ප්‍රමාණය 1991 වර්ෂයේදී කිලෝ වොට් පැය 3,116ක් වූ අතර, එය සියයට 1 ක සුළු අඩුවීමක් වාර්තා කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ගෙවුම් ශේෂයට සැලකිය යුතු බලපෑමක් කරමින්, තාප විදුලියබල ජනනය පසුගිය වර්ෂය තුළ කිලෝ වොට් පැය දශ ලක්ෂ 5 ක නොසැලකිය යුතු මට්ටමක සිට 1991 වර්ෂය තුළ කිලෝ වොට් පැය දශ ලක්ෂ 260 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. මේ අතර, 1990 වර්ෂයේ කිලෝවොට් පැය දශලක්ෂ 589 හෝ මුළු උත්පාදනයෙන් සියයට 19 හා සසඳන විට 1991 වර්ෂයේ විදුලියබල උත්පාදන හා බෙදා හැරීමේදී දරිමට සිදු වූ පාඩුව කිලෝ වොට් පැය දශ ලක්ෂ 567 හෙවත් මුළු උත්පාදනයෙන් සියයට 17 ක් දක්වා අඩු විය.

සලකා බලන ලද වර්ෂය තුළ, විදුලිය බල අලෙවිය කිලෝවොට් පැය දශලක්ෂ 2,810 ක් විය. මෙය 1990 වර්ෂයේ සියයට 11 ක වැඩිවීම සමඟ සසඳන විට සියයට 8 ක වැඩිවීමකි. 1990 වර්ෂයේ 629,000 වූ පාරිභෝගික සංඛ්‍යාව 1991 වර්ෂයේදී 765,000 දක්වා වැඩිවීම, ගෘහස්ථ අංශයේ විදුලිය බල අලෙවිය සියයට 27 කින් වැඩිවීමට විශාල වශයෙන් හේතු විය. මේ අතර, වාණිජ සහ කාර්මික අංශ සඳහා වූ විදුලිය අලෙවි කිරීම, 1990 වර්ෂයේ පිළිවෙළින් සියයට 16 සහ සියයට 8 ක් සමඟ සසඳන විට, 1991 වර්ෂයේ පිළිවෙළින් සියයට 12 සහ සියයට 5 බැගින් වැඩිවිය. කෙසේ වුවද, සලකා බලන කාලපරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතනවලට කළ විදුලිය තොග විකුණුම් සියයට 8 කින් අඩු විය. මේ අතර, 1990 අප්‍රේල් මාසයේදී ප්‍රතිශෝධනය කළ විදුලිය බල ගාස්තු ව්‍යුහය 1991 වර්ෂය තුළ නොවෙනස්ව පැවතුණි.

## 1.24 සංඛ්‍යා සටහන
## බලශක්ති අංශයේ මූලික ලක්ෂණ 1990 - 1991

| ශීර්ෂය | ඒකක | 1990 | 1989 වඩා ප්‍රතිශත වෙනස | 1991* | 1990 වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඛනිජ තෙල් නිෂ්පාදන | | | | | |
| 1.1 අපනයනය .. | රු. ද. ල. | 3,973.8 | 77.3 | 3,289.4 | -17.2 |
| එම .. | විගැහි ද. ල | 73.0 | 50.5 | 58.1 | -20.4 |
| 1.2 ආනයනය .. | රු. ද. ල. | 14,371.5 | 71.6 | 12,887.2 | -10.3 |
| එම .. | විගැහි ද. ල. | 264 | 45.6 | 227.6 | 23.8 |
| 1.3 ආනයනය කල ප්‍රමාණය .. | | | | | |
| 1.3.1 බොර තෙල් .. | මෙ. ටො. | 1,778,866 | 39.5 | 1,625,522 | -8.6 |
| 1.3.2 පිරිපහදු නිෂ්පාදන .. | මෙ. ටො. | 124,986 | -66.6 | 215,753 | 72.6 |
| 1.3.3 අනෙකුත් නිෂ්පාදන .. | මෙ. ටො | 29,055 | 36.3 | 25,801 | -11.2 |
| 1.4 බොර තෙල් බැරලයක | | | | | |
| සාමාන්‍ය මිළ .. | රුපියල් | 942.51 | 50.0 | 806.76 | -14.4 |
| එම .. | එ. ජ. ඩොලර් | 23.53 | 35.0 | 19.50 | -17.1 |
| 1.5 දේශීය අලෙවිය | | | | | |
| 1.5.1 පෙට්‍රල් .. | මෙ. ටො. | 178,948 | 3.5 | 159,765 | -10.7 |
| 1.5.2 ඔටෝ ඩීසල් .. | ,, | 512,670 | 6.0 | 539,983 | 5.3 |
| 1.5.3 බැර ඩීසල් .. | ,, | 20,079 | -11.7 | 32,528 | 62.0 |
| 1.5.4 සුපිරි ඩීසල් .. | ,, | 16,681 | 0.6 | 19,989 | 19.8 |
| 1.5.5 භූමි තෙල් .. | ,, | 167,196 | 4.5 | 173,425 | 3.7 |
| 1.5.6 දැවි තෙල් .. | ,, | 160,459 | 6.2 | 204,356 | 27.4 |
| 1.6 දේශීය මිල | | | | | |
| 1.6.1 පෙට්‍රල් .. | රු./ලීටර | 30.00 | 50.0 | 30.00 | - |
| 1.6.2 ඔටෝ ඩීසල් .. | ,, | 11.00 | 14.6 | 11.00 | - |
| 1.6.3 බැර ඩීසල් .. | ,, | 10.60 | 15.2 | 10.60 | - |
| 1.6.4 සුපිරි ඩීසල් .. | ,, | 13.00 | 19.3 | 13.00 | - |
| 1.6.5 භූමි තෙල් .. | ,, | 8.80 | 33.7 | 8.80 | - |
| 1.6.6 දැවි තෙල් .. | | | | | |
| 500 .. | ,, | 6.60 | 32.0 | 6.55 | -0.8 |
| 800 .. | ,, | 6.30 | 34.0 | 6.25 | -0.8 |
| 1000 .. | ,, | 6.00 | 31.9 | 5.95 | -0.8 |
| 1.6.7 තාර .. | ,, | 11.00 | 30.2 | 10.90 | -0.9 |
| 2. විදුලි බලය | | | | | |
| 2.1 ස්ථාපිත ධාරිතාවය .. | මෙගවොට් | 1,289.65 | 3.9 | 1,289.65 | - |
| 2.1.1 ජල බලය .. | ,, | 1,017.45 | 5.1 | 1,017.45 | - |
| 2.1.2 තාප බලය .. | ,, | 272.20 | - | 272.20 | - |
| 2.2 ජනනය කල ඒකක .. | කි.වො.පැ.ද.ල. | 3,149.7 | 10.2 | 3,376.6 | 7.2 |
| 2.2.1 ජල බලය .. | ,, | 3,144.6 | 12.2 | 3,116.2 | -0.9 |
| 2.2.2 තාප බලය .. | ,, | 5.1 | -91.0 | 260.4 | 5,005.9 |
| 2.3 මුළු අලෙවිය .. | කි.වො.පැ.ද.ල. | 2,608.1 | 1.1 | 2,810.1 | 7.7 |
| 2.3.1 ගෘහස්ත .. | ,, | 514.3 | 22.2 | 654.5 | 27.3 |
| 2.3.2 කාර්මික .. | ,, | 909.6 | 7.7 | 958.6 | 5.4 |
| 2.3.3 වාණිජ .. | ,, | 509.0 | 15.5 | 568.0 | 11.6 |
| 2.3.4 පළාත් පාලන ආයතන | ,, | 657.3 | 5.4 | 608.2 | -7.5 |
| 2.3.5 වීදි ආලෝක කිරීම .. | ,, | 17.9 | 4.1 | 20.8 | 16.2 |

* තාවකාලිකයි

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව:
ලංකා විදුලිබල මණ්ඩලය

දේශීය ඛනිජතෙල් නිෂ්පාදිත පරිභෝජනය, 1991 වර්ෂයේදී මෙට්‍රික් ටොන් දහස් 1,203 (ලීටර් දශ ලක්ෂ 1,439) දක්වා සියයට 8 කින් ඉහළ නැගුණි. 1991 වර්ෂයේදී ඔටෝ ඩීසල් සඳහා ඉල්ලුම, සාපේක්ෂ මිල වෙනස්වීම්වල බලපෑමෙන් මෙට්‍රික් ටොන් දහස් 540 (ලීටර් දශ ලක්ෂ 638) වූ අතර එය සියයට 5ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මේ අතර පෙට්‍රල් සඳහා ඉල්ලුම මෙට්‍රික් ටොන් දහස් 160 (ලීටර් දශ ලක්ෂ 210) වූ අතර එය සියයට 11 ක අඩුවීමක් වාර්තා කරන ලදී. මේ අතර භූමිතෙල් පරිභෝජනය 1990 වර්ෂයේ මෙට්‍රික් ටොන් දහස් 167 (ලීටර් දශ ලක්ෂ 213) සිට 1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් දහස් 173 (ලීටර් දශ ලක්ෂ 220) දක්වා වැඩි විය. කර්මාන්ත කටයුතුවල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින් දැවි තෙල් අලෙවිය පසුගිය වර්ෂයේ සියයට 6 ක වැඩිවීමක් සමඟ සසඳන විට 1991 වර්ෂයේ සියයට 27කින් වැඩි විය. 1991 වර්ෂයේ ද්‍රව ඛනිජ වායු අලෙවියද මෙට්‍රික් ටොන් 37,522 දක්වා සියයට 10 කින් වැඩි විය. දැවිතෙල් සහ තාර හැර, අනෙකුත් සියලුම ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල වසර පුරා නොවෙනස්ව පැවතුණි.

1991 වර්ෂයේ විශේෂ ගැණුම් හිමිකම් දශලක්ෂ 228 (රුපියල් දශ ලක්ෂ 12,887) වූ ඛනිජ තෙල් ආනයන වියදම වර්ෂයේ මුළු ආනයන වලින් සියයට 10 ක් විය. බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල, 1990 වර්ෂයේදී ඇමරිකන් ඩොලර් 23.53 (රුපියල් 943) ක් වූ අතර, 1991 වර්ෂයේදී ඇමරිකන් ඩොලර් 19.50 (රුපියල් 807) දක්වා අඩු විය. තවද 1991 පෙබරවාරි මාසය තුළ නඩත්තු කටයුතු සඳහා තෙල් පිරිපහදුව වසා දැමීම විශාල වශයෙන් හේතුකොට 1990 වර්ෂයේ මෙට්‍රික් ටොන් දහස් 1,779 වූ බොර තෙල් ආනයන ප්‍රමාණය 1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් දහස් 1,626 දක්වා අඩු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පිරිපහදු නිෂ්පාදිත ආනයන ප්‍රමාණය 1990 වර්ෂයේ මෙට්‍රික් ටොන් 124,986 සිට 1991 වර්ෂයේ මෙට්‍රික් ටොන් 215,753 දක්වා වැඩිවිය. මේ අතර 1991 වර්ෂයේ අපනයන කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 523,211 වූ අතර එය සියයට 16 ක අඩුවීමක් වාර්තා කරන ලදී. මේ සමඟම ඇති වූ 1991 වර්ෂයේ ඛනිජ තෙල් මිල අඩුවීම, ඛනිජ තෙල් අපනයන ඉපැයුම් 1990 විශේෂ ගැණුම් හිමිකම් දශ ලක්ෂ 73 (රුපියල් දශ ලක්ෂ 3,974) සිට 1991 වර්ෂයේ විශේෂ ගැණුම් හිමිකම් දශ ලක්ෂ 58 (රුපියල් දශ ලක්ෂ 3,289) දක්වා අඩු වීමට දායක විය.

## ගමනාගමනය

1991 වර්ෂයෙහිදී ගමනාගමන අංශයේ කටයුතුවල ප්‍රගතියක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂයේ සියයට 28 ක තියුණු වැඩිවීමක් වාර්තා කළ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන කිලෝමීටර් ප්‍රමාණය දුම්රිය සේවාවෙහි ඇතිවූ ප්‍රසාරණයන් හේතුකොටගෙන 1991 දී සියයට 4 කින් තවදුරටත් ඉහළ ගියේය. 1991 වර්ෂයේ දී බස්රථ 3000 කට වැඩි සංඛ්‍යාවක් ආනයනය කිරීමත් සමඟම මගී ප්‍රවාහන සේවයද අඛණ්ඩව ප්‍රසාරණය විය. ජාතික සංවර්ධන බැංකුව මගින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් සහ රජය මගින් පිරිනමන ලද බදු සහන මෙම ප්‍රගතිය සඳහා ඉවහල්විය. මේ අතර, බස්රථ මගින්, මගී ප්‍රවාහනය කිරීම වැඩිදියුණු කිරීමේ අරමුණෙන් 1991 සැප්තැම්බර් මාසයේදී "ජාතික ගමනාගමන කොමිෂන් සභාව" පිහිටුවන ලදී. තවද, පෞද්ගලික අංශයේ මගී ගාස්තු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මගී ගාස්තු සමඟ සම මට්ටමකට ගෙන ඒම මගින් බස් ගාස්තුවල පැවැති අසමානතාව නිවැරදි කරන ලදී.

1991 වර්ෂයෙහිදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන පරිමාව කිලෝමීටර් දශ ලක්ෂ 8 ක් දක්වා සියයට 4 කින් ඉහළ ගියේය. පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී මගී කිලෝමීටර් ප්‍රමාණය දශ ලක්ෂ 2,698 දක්වා සියයට 3 ක අඩුවීමක් වාර්තා කළද භාණ්ඩ ප්‍රවාහනය දක්වෙන බඩු ටොන් කිලෝමීටර් ප්‍රමාණය දශ ලක්ෂ 170 දක්වා සියයට 4 කින් වැඩිවිය. උතුරු සහ නැගෙනහිර පළාත්වල අඛණ්ඩව පැවති අභ්‍යන්තර කලබල එම ප්‍රදේශයන්හි දුම්රිය සේවාවේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑම් ඇති කළේය. 1991 වර්ෂය තුළ තලෙයිමන්නාරම දුම්රිය මාර්ගයේ සේවා

අත්හිටුවන ලද අතර, උතුරු සහ මඩකලපුව මාර්ගයන්හි එම සේවා කපාහරින ලදී. කෙසේ වුවද, මෙම ප්‍රදේශයන්හි ධාවන පරිමාව පහළයාම නිසා ඇතිවූ අහිතකර බලපෑම දිවයිනේ අනිකුත් ප්‍රදේශයන්හි ධාවන කටයුතුවල ඇතිවූ වර්ධනය මගින් සමහන් විය. කොළඹ පුත්තලම මාර්ගයේ නව දුම්රිය 5 ක් 1991 ජූනි මාසයේදී හඳුන්වා දුන් අතර රාගම සහ කොළඹ කොටුව අතරද නව දුම්රිය සේවයක් ආරම්භ කරන ලදී. කොළඹ හා බදුල්ල අතර දුම්රිය සේවය සති අන්ත මගීන්ගේ පහසුව පිණිසද යොදවනු ලැබීය. මෙයට අමතරව, 1991 වර්ෂයේදී, නගරාසන්න ප්‍රදේශයේ වඩාත් දියුණු මගී ප්‍රවාහන සේවයක් පවත්වා ගෙනයාමේ අරමුණෙන් නව ඩීසල් බලවේග දුම්රිය කට්ටල 20 ක් යොදවන ලදී. මෙම වර්ධනයන් පිළිඹිබු කරමින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 656 දක්වා සියයට 13 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, රුපියල් දශ ලක්ෂ 1,240ක් වූ ක්‍රියාකාරී වියදම සමඟ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරී අලාභය පසුගිය වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 276 සිට 1991 දී රුපියල් දශ ලක්ෂ 584 දක්වා වැඩිවිය.

**1.25 සංඛ්‍යා සටහන**

**ගමනා ගමන අංශයේ මූලික ලක්ෂණ 1990 - 1991**

| | ඒකකය | 1990 | 1989 ට වඩා ප්‍රතිශත වෙනස | 1991* | 1990 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් | | | | | |
| 1.1 ශ්‍රී. ලං. ග. ම. බස්රථ | සංඛ්‍යාව | 78 | -70.0 | 189 | 142.3 |
| 1.2 පෞද්ගලික බස්රථ | ,, | 1071 | 141.2 | 2,987 | 178.9 |
| 1.3 පෞද්ගලික මෝටර්රථ (අ) | ,, | 15,144 | 27.0 | 15,076 | -0.4 |
| 1.4 මෝටර් බයිසිකල් | ,, | 84,424 | 26.6 | 58,643 | -30.5 |
| 1.5 භාණ්ඩ ප්‍රවාහන වාහන | ,, | 2,776 | 13.0 | -3,200 | 15.3 |
| 1.6 ඉඩම් වාහන | ,, | 2,672 | 2.7 | 4,003 | 49.8 |
| 1.7 වෙනත් | ,, | 59 | 321.4 | 76 | 28.8 |
| 2 ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී. ලං. දු. සේ.) | | | | | |
| 2.1 ධාවන කිලෝ මීටර් | දශ ලක්ෂ | 7.3 | 28.0 | 7.6 | 4.1 |
| 2.2 මගී කිලෝමීටර් | ,, | 2,780.9 | 60.4 | 2,698.1 | -3.0 |
| 2.3 බඩු ටොන් කිලෝමීටර් | ,, | 163.8 | -3.5 | 170.3 | 4.0 |
| 2.4 මුළු ආදයම | රුපියල් දශ ලක්ෂ | 680 | 48.6 | 745 | 9.6 |
| 2.5 මුළු වියදම | ,, | 1,057 | 19.7 | 1,200 | 13.5 |
| 2.6 අතිරික්තය (+) / හිගය (-) | ,, | -477 | 12.1 | -455 | +4.6 |
| 3 ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.) | | | | | |
| 3.1 ධාවන කිලෝ මීටර් | දශ ලක්ෂ | 245.4 | -5.9 | 247.0 | 0.7 |
| 3.2 මගී කිලෝ මීටර් | ,, | 13,327.0 | 2.7 | 11,454.0 | -14.1 |
| 3.3 මුළු ආදයම | රුපියල් දශ ලක්ෂ | 2,617.8 | 16.7 | 2,761.0 | 5.5 |

* තාවකාලික
(අ) ද්විත්ව කාර්යා වාහනද ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා දුම්රිය සේවය,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය.

1991 දී බස්රථ මගී ප්‍රවාහන සේවාව සැලකියයුතු පරිදි පුළුල්විය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරණලද පෞද්ගලික මගී ප්‍රවාහන බස්රථද ඇතුළත්වූ මුළු බස්රථ සංඛ්‍යාව පසුගිය වර්ෂයේ පැවති ගණන වන 1,149 සමඟ සසඳන විට 1991 දී 3,176ක් විය.

ජාතික සංවර්ධන බැංකුව මගින් සපයන ලද ණය පහසුකම් යටතේ පෞද්ගලික අංශය විසින් ආනයනය කරන ලද බස්රථ සංඛ්‍යාව 1990 දී 731ක් වූ අතර 1991 දී 1,073 ක් විය.

**නිවාස ඉදිකිරීම්**

1990 වර්ෂයේ සිට වසර 6 ක් සඳහා ක්‍රියාත්මක වන නිවාස පහළොස් ලක්ෂයේ වැඩ සටහන යටතේ පවුල් ලක්ෂ 15 ක් සඳහා නව නිවාස ඉදිකිරීම, පවතින නිවාසවල තත්ත්වය ඉහළ නැංවීම සහ දුප්පත් ජනතාවගේ නිවාස වැඩිදියුණු කිරීම සඳහා ණය ආධාර සැපයීමට අපේක්ෂා කරන අතර 1991 වර්ෂයේදී මෙම වැඩසටහනෙහි සැලකියයුතු ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහනේ ප්‍රධාන උප වැඩ සටහන් දෙකක් ක්‍රියාත්මක කිරීමේ වගකීම භාරව සිටින නිවාස සංවර්ධන අධිකාරිය 1990 වර්ෂයේ පවුල් 33,677 කට සාපේක්ෂව, 1991 වර්ෂයේ පවුල් 34,733 කට ණය ලබා දී ඇත. තවද, නිවාස පහළොස් ලක්ෂයේ වැඩ සටහනේ විශාලතම උප වැඩසටහන වන ග්‍රාමීය නිවාස උප-වැඩසටහන යටතේ එක පවුලකට දෙන උපරිම ණය සීමාව වන රුපියල් 12,500 ට යටත්ව පවුල් 29,704 කට 1991 වර්ෂය තුළ ණය ලබා දී ඇත. මේ යටතේ නිවාස ඒකක 25,372 ක් 1991 වර්ෂය තුළ තනා නිම කළ අතර, රුපියල් දශ ලක්ෂ 258 ක් මෙම වැඩසටහන යටතේ ණය වශයෙන් සපයා ඇත. නාගරික නිවාස උප-වැඩසටහන යටතේ, නාගරික අඩු ආදායම් පවුල්වල නිවාස තත්ත්වය දියුණු කිරීම සඳහා අඩු ආදායම් ලබන පවුල් 5,029 කට ණය පහසුකම් ලබාදෙන ලදී. මේ අතර, ආපදා නිවාස උප-වැඩසටහන යටතේ ණය ලාභීන් 13,707 අතරේ රුපියල් දශ ලක්ෂ 128 ක් බෙදා දුන් අතර නිවාස ඒකක 4,004 ක ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වූ වැවිලි නිවාස උප-වැඩසටහන, සෙවිලි කිරීමට යොදා ගනු ලබන ආනයන තහඩු ප්‍රමාදය හේතුකොටගෙන ප්‍රමාදයට පත්වූ ප්‍රති සෙවිලි වැඩසටහන හැරුණුවිට සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. තාවකාලික දත්තයන්ට අනුව, 1991 වර්ෂයේදී, ජනතා වතු සංවර්ධන මණ්ඩලය නව නිවාස 119 ක් සම්පූර්ණ කිරීමට සමත්වූ අතර, නිවාස ඒකක 534 ක තත්ත්වය වැඩිදියුණු කරන ලදී. මේ අතර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව නව නිවාස 40 ක් සම්පූර්ණ කළ අතර නිවාස ඒකක 30 ක තත්ත්වය වැඩිදියුණු කරන ලදී. එසේම, සලකා බලන වර්ෂය තුළ, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිළිවෙළින් නිවාස 1924 කට සහ 3,265 කට වැසිකිලි පහසුකම් ලබාදීම සිදු කරන ලදී. 1991 වර්ෂයේදී, මහවැලි ආර්ථික ඒජන්සියේ වගකීම යටතේ පවතින මහවැලි නිවාස උප-වැඩසටහන යටතේ එච්.බී.සී. හා එල් කලාපයන්හි පවුල් 4,721 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 18 ක් මූල්‍ය ආධාර වශයෙන් ලබා දෙන ලදී. මේ අතර, පෞද්ගලික අංශයේ නිවාස සංවර්ධන කටයුතු සඳහා, ප්‍රධාන බැංකු හා මූල්‍ය ආයතන ස්වකීය ණය ක්‍රම දිගට ම ක්‍රියාත්මක කරන ලදී. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස හා දේපල සංවර්ධනයට නිවාස ණය සපයනු ලබන ප්‍රධානතම මූලාශ්‍රය ලෙස දිගටම කටයුතු කරමින් නිවාස ණය 2,055 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 282 ක් 1991 වර්ෂය තුළ ලබා දී ඇත. කෙසේ වුවද, පසුගිය වර්ෂය හා සැසඳීමේදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නිවාස ණය යෝජනාක්‍රමය යටතේ ලබා දී ඇති නිවාස ණය සංඛ්‍යාව සියයට 22 කින් අඩු විය.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව ද නිවාස ණය ලබාදීම මගින් 1991 වර්ෂයේදී නිවාස අංශයට දායක වී ඇත. බැංකුව විසින් 1991 දී නිවාස ණය 565 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 66 ක් ලබා දී ඇති අතර, 1990 වර්ෂයේදී ලබා දී තිබුනේ නිවාස ණය 591ක් සඳහා රුපියල් දශ ලක්ෂ 70 කි. නිවාස ණය මුදල් සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව අයකරන ලද පොලී වර්ෂය තුළ පිළිවෙළින් සියයට 19 සිට 20.5 ක් සහ සියයට 18 සිට 22 දක්වා වෙනස් විය. ලංකා බැංකුව සහ මහජන බැංකුව, සලකා බලන වර්ෂය තුළ, පිළිවෙළින් රුපියල්

## 1.26 සංඛ්‍යා සටහන
## නිවාස ලක්ෂ 15 වැඩ සටහනෙහි ක්‍රියාකාරීත්වය 1990 - 1991

| උප වැඩසටහන | ණය ලබාගත් පවුල් ගණන | | නිම කල ඒකක ගණන | | මුදා හරින ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | |
|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1990 | 1991 | 1990 | 1991 |
| ග්‍රාමීය නිවාස උප වැඩසටහන | 28,563 | 29,704 | 14,472 | 25,372 | 186.95 | 257.62 |
| නාගරික නිවාස උප වැඩසටහන | 5,114 | 5,029 | 2,709 | 5,522 | 32.98 | 49.90 |
| පලාත් සභා නිවාස උප වැඩසටහන | 1,070 | 1,422 | 128 | 1,160 | 3.89 | 9.99 |
| විපතට පත් නිවාස උප වැඩසටහන | 3,012 | 13,707 | 161 | 4,004 | 30.82 | 128.06 |
| වතුකරයේ නිවාස උප වැඩසටහන* | 300 | 300 | - | - | 0.91 | - |
| මහවැලි නිවාස උප වැඩසටහන | 9,751 | 4,721 | 4,129** | 3,714** | 31.07*** | 17.60*** |
| සේවක නිවාස උප වැඩසටහන | 1,010 | 1,056 | 130 | 145 | 34.70 | 260.48 |
| මුළු ගණන | 48,820 | 55,939 | 21,729 | 39,917 | 321.32 | 723.65 |

* ජනවසම හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අයත් නොවේ.
** මහවැලි ආර්ථික ඒජන්සිය, යුරෝපා ආර්ථික කොමිසම, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ සහ උප පවුල් විසින් නිම කරන ලද නිවාස
*** මහවැලි ආර්ථික ඒජන්සිය මගින් නව පදිංචිකරුවන් සඳහා කරන ලද ප්‍රදානයන්

මූලයන්: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
මහවැලි ආර්ථික ඒජන්සිය

දශ ලක්ෂ 687 ක් සහ 384 ක් ප්‍රදානය කර ඇත. මේ අතර, සීමාසහිත නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පෙර වර්ෂයේ නිවාස ණය 113 ක් සඳහා ප්‍රදානය කළ රුපියල් දශ ලක්ෂ 12 සමඟ සැසඳීමේදී මේ වර්ෂයේ නිවාස ණය 524 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 52 ක් ප්‍රදානය කරන ලදී. එසේම ගාල්ල, කෑගල්ල, ගම්පහ සහ කළුතර ශාඛා පිහිටුවමින් මෙම සංස්ථාව තම ශාඛා පද්ධතිය ද 1991 වර්ෂය තුළ පුළුල් කරන ලදී.

## නාගරික සංවර්ධනය

1991 වර්ෂයේදී නාගරික සංවර්ධනය හා සම්බන්ධ කටයුතු වල සැලකියයුතු වැඩිවීමක් පිළිඹිබු කරමින් නාගරික සංවර්ධන කටයුතු සඳහා වූ මුළු වියදම 1990 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 315 සිට 1991 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 1,184 දක්වා ඉහළ නැඟුණි. එම වියදම් කරන ලද මුළු මුදලින් රුපියල් දශ ලක්ෂ 943 ක් හෙවත් සියයට 80 ක් සමාජ හා සංස්කෘතික ව්‍යාපෘති සඳහා යොදවන ලද අතර රුපියල් දශ ලක්ෂ 87 ක් අනුග්‍රාහකයින් වෙනුවෙන් බාරගත් ව්‍යාපෘති සඳහා වැය කරන ලදී. මේ අතර, ඉඩම් බැංකුව විසින් මිළදී ගන්නා ලද සංවර්ධනය නොකරන ලද හා මුඩු ඉඩම් සඳහා රුපියල් දශලක්ෂ 89 ක් වැය කරන ලදී. තවද රුපියල් දශලක්ෂ 61 ක් ඒකාබද්ධ හා කාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය කරන ලදී.

## මහාමාර්ග සහ දුම්රිය මාර්ග

1991 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය මගින් නඩත්තු කරන ලද මාර්ග පද්ධතිය කිලෝමීටර් 10,448 ක් වූ අතර එමගින් නඩත්තු කළ පාලම් සංඛ්‍යාව 3,244 කි. මේ අතර, මාර්ග ඉදිකිරීම සඳහා වූ මුළු ආයෝජන වියදම රුපියල් දශ ලක්ෂ 1529 ක් වූ අතර මාර්ග නඩත්තුව සඳහා වූ වියදම රුපියල් දශලක්ෂ 177 ක් විය.

ආසියාතු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද ප්‍රධාන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඕමාරගොල්ල - දඹුල්ල - අනුරාධපුර මාර්ගයේ ජලය බැස යාමේ සැලසුම් සම්පූර්ණයෙන්ම පාහේ අවසන් විය. මේ අතර, ආසියාතු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සැපයූ, මාර්ග වැඩිදියුණු කිරීමේ දෙවැනි ව්‍යාපෘතිය යටතේ හෝමාගම - අවිස්සාවේල්ල - හැටන් මාර්ගයේ වැඩකටයුතු නිම කරන ලදී.

පසුගිය වර්ෂයේ මෙන්ම 1991 වර්ෂයේදීද, දුම්රිය මාර්ග පද්ධතිය කිලෝමීටර් 1944 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, වැඩිම මගී හා භාණ්ඩ ප්‍රමාණයක් ප්‍රවාහනය කරනු ලබන ගාල්ල සිට මහනුවර සහ රාගම සිට මීගමුව දක්වා මාර්ග ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතු ද 1991 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කරන ලදී.

## පණිවුඩ හුවමාරු සේවා

විදුලි සංදේශ දෙපාර්තමේන්තුව මගින් මෙතෙක් සපයන ලද පණිවුඩ හුවමාරු සේවා සැපයීම සඳහා 'ශ්‍රී ලංකා ටෙලිකොම්' ආරම්භ කිරීම 1991 වර්ෂයේදී පණිවුඩ හුවමාරු අංශයේ ඇතිවූ වැදගත් සිදුවීමකි. ශ්‍රී ලංකා ටෙලිකොම්හි ප්‍රධාන අරමුණ වන්නේ විශ්වශනීය හා කාර්යක්ෂම පණිවුඩ හුවමාරු පද්ධතියක් සැපයීම යි.

මෙම වර්ෂයේදී ද, විදුලි පණිවුඩ පහසුකම් සඳහා වැඩි ඉල්ලුමක් පැවතුණි. 1991 වර්ෂයේදී නව දුරකථන සඳහා පුද්ගලයන් 61,313 අයදුම් කර තිබුණද විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සමග

## 1.27 සංඛ්‍යා සටහන
## තැපැල් සහ විදුලි සංදේශ සේවාවේ වර්ධනය 1988 - 1991

| ශීර්ෂය | 1988 | 1989 | 1990 | 1991* |
|---|---|---|---|---|
| 1. තැපැල් සේවය | | | | |
| 1.1 තැපැල් බෙදීමේ කොට්ඨාශ ගණන .. | 6,621 | 6,630 | 6,636 | 6,729 |
| 1.2 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ප්‍රදේශය (වර්ග කි. මී.) .. | 17.0 | 16.8 | 16.6 | 16.5 |
| 1.3 තැපැල් කාර්යාල සංඛ්‍යාව .. | 3,869 | 3,908 | 3,945 | 3,982 |
| 1.3.1 රාජ්‍ය අංශය .. | 3,829 | 3,841 | 3,864 | 3,884 |
| 1.3.2 පෞද්ගලික අංශය .. | 40 | 67 | 81 | 98 |
| 1.4 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ජන සංඛ්‍යාව .. | 4,306 | 4,406 | 4,398 | 4,450 |
| 1.5 එක් පදිංචිකරුවෙකුට ලැබුණු ලිපි ගණන .. | 32 | 28 | 29 | 28 |
| 2. විදුලි සංදේශ සේවය | | | | |
| 2.1 දේශීය දුරකථන සේවය .. | | | | |
| 2.1.1 දුරකථන සංඛ්‍යාව .. | 104208 | 105,007 | 121,388 | 125,834 |
| 2.1.2 අළුතින් දෙනු ලැබූ දුරකථන සංඛ්‍යාව .. | 5,000 | 6,087 | 10,241 | 6,579 |
| 2.1.3 පොරොත්තු ලේඛණයේ සිටින ගණන .. | 50,994 | 48,400 | 47,945 | 61,313 |
| 2.1.4 දුරකථන සඳහා ඉල්ලුම .. | 155,202 | 153,407 | 169,333 | 187,147 |
| 2.1.5 දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100කට දුරකථන ගණන). . | 0.62 | 0.62 | 1.00 | 1.09 |
| 2.2 විදේශ විදුලි සංදේශ සේවය | | | | |
| 2.2.1 ටෙලෙක්ස් සම්බන්ධක ගණන .. | 1,535 | 1,591 | 1,666 | 1,740 |
| 2.2.2 පොරොත්තු ලේඛණයේ සිටින ගණන .. | 127 | 59 | 89 | 84 |
| 2.2.3 එතෙර ඇමතුම් .. | | | | |
| 2.2.3.1 එතෙර දුරකථන ඇමතුම් (අ) .. | 6,980,022 | 8,038,000 | 9,006,000 | 14,624,355 |
| 2.2.3.2 එතෙර විදුලි පණිවිඩ (ආ) .. | 3,359,723 | 3,023,000 | 2,720,000 | 2,348,803 |
| 2.2.3.3 එතෙර ටෙලෙක්ස් පණිවිඩ (අ) .. | 4,824,658 | 4,777,000 | 4,472,122 | 4,140,000 |

(අ) සංඛ්‍යා දැක්වෙන්නේ මිනිත්තු වලිනි.
(ආ) සංඛ්‍යා දැක්වෙන්නේ වචන වලිනි.
* තාවකාලිකයි.

මූලයන් : තැපැල් දෙපාර්තමේන්තුව,
විදුලි සංදේශ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා ටෙලිකොම්.

ශ්‍රී ලංකා ටෙලිකොම් සපයන ලද දුරකථන සංඛ්‍යාව 1990 දී 10,241 ක්ද 1991 දී 6579 ක් ද විය. ඒ අනුව 1991 වර්ෂයේදී මහජනතාවට සපයන ලද දුරකථන සංඛ්‍යාව 125,834 ක් දක්වා සියයට 4 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර 1991 දී ටෙලෙක්ස් සම්බන්ධක සංඛ්‍යාව 1740 දක්වා සියයට 4 කින් වැඩි විය. විමසුමට ලක්වන වර්ෂයේදී එතෙර දුරකථන මෙහෙයුම් සංඛ්‍යාව සියයට 62 කින් ඉහළ ගිය අතර එතෙර විදුලිපණිවුඩ සහ ටෙලෙක්ස් පණිවුඩ සංඛ්‍යාව පිළිවෙළින් සියයට 14 කින් සහ සියයට 7 කින් පහළ ගියේය.

පවත්නා විදුලි සංදේශ පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංවිධානය කිරීම ඇතුළත් ප්‍රධාන සංවර්ධන වැඩකටයුතු 1991 වර්ෂයේදී ද අඛන්ඩව ක්‍රියාත්මක විය. වර්ෂයේදී ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති අතරට විදුලි සංදේශ සේවාවේ සාමාන්‍ය සංවර්ධන කටයුතු, ලෝක ව්‍යාප්ත වාණිජමය පණිවුඩ භුවමාරු චන්ද්‍රිකා පද්ධතිය සඳහා ප්‍රාග්ධන දායකත්වය විදේශ පණිවුඩ හුවමාරු සේවා, මහ කොළඹ ආර්ථික බල ප්‍රදේශයේ පණිවුඩ හුවමාරු පද්ධතිය වැඩි දියුණු කිරීමේ 11 වැනි අදියර සහ ගම්පහ දිස්ත්‍රික්කයේ පණිවුඩ හුවමාරු පද්ධතිය දියුණු කිරීම ඇතුළත් වේ. මෙයට අමතරව, මාතර දිස්ත්‍රික්කයේ පණිවුඩ හුවමාරු පද්ධතියට සම්බන්ධිත ගොඩනැගිලි ඉදිකිරීමද නිම කරන ලදී.

දේශීය පාර්සල් සහ විදේශ තැපැල් මෙහෙයුම් සංඛ්‍යාව අඩුවීම හේතුකොටගෙන විමසුමට ලක්වන වර්ෂයේදී, තැපැල් දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද තැපැල් භාණ්ඩ සංඛ්‍යාව 1990 දී දශ ලක්ෂ 519 සිට 1991 දී දශ ලක්ෂ 518 දක්වා සියයට 0.4 කින් සුළු වශයෙන් අඩුවිය. 1991 දී දේශීය පාර්සල් මෙහෙයවීම 586,000 දක්වා සියයට 0.7 කින් සුළු වශයෙන් පහළ ගිය අතර විදේශ තැපැල් මෙහෙයුම් සංඛ්‍යාව දශලක්ෂ 69 දක්වා සියයට 3 කින් අඩු විය. කෙසේ වුවද, දේශීය තැපැල් මෙහෙයුම් සංඛ්‍යා 1990 දී දශ ලක්ෂ 445.8 සිට 1991 දී දශ ලක්ෂ 446 දක්වා ඉහළ ගියේය. මේ අතර, විදේශ පාර්සල් මෙහෙයුම් සංඛ්‍යාව 71,000 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

1990 වර්ෂයේ දී 3,945 ක් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව 1991 වර්ෂයේදී 3,982 දක්වා වැඩිවිය. මේ අනුව, එක් තැපැල් කාර්යාලයකින් සේවාව සපයනු ලබන භූමි ප්‍රමාණය 1990 දී වර්ග කිලෝමීටර් 16.6 ක්ව තිබී 1991 දී එය වර්ග කිලෝමීටර් 16.5 දක්වා පහළ ගියේය. තැපැල් සේවාව මහජනයා සඳහා කොතරම් සුලභ සහ පහසු සේවාවක් වීද යන්න මෙයින් දක්වේ. මේ අතර 1990 දී 29 ක් වූ එක් අයෙකුට ලැබෙන ලිපි සංඛ්‍යාව 1991 දී 28 දක්වා අඩු විය.

## ජනසවිය වැඩපිළිවෙල

ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්කයන් ඇතුළත් වන පරිදි උප දිසාපති කොට්ඨාශ 28 ක පවුල් 154,345 සඳහා 1989 ඔක්තෝම්බර් මාසයේ ආරම්භ කළ ජනසවිය වැඩපිළිවෙලේ පළමු වටය, පරිභෝජනය සඳහා නොකඩවා ආධාර ලබාදුන් මාස 24 ක කාලයකින් පසු 1991 සැප්තැම්බර් මාසයේදී සම්පූර්ණ විය. තවද, 1990 දෙසැම්බර් මාසයේ උප දිසාපති කොට්ඨාශ 22 ක පවුල් 104,080 ක් සඳහා ආරම්භ කළ දෙවැනි වටය 1991 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. 1991 වර්ෂයේදී පළමු හා දෙවන වට යටතේ ජනසවි ලාභීන්ට පාරිභෝජන ආධාර සැපයීමට ගිය මුළු වියදම රුපියල් දශ ලක්ෂ 3,497 ක් විය. ජනසවිය වැඩපිළිවෙළ ආරම්භයේ සිට 1991 අග දක්වා දුගී අයට පාරිභෝගික ආධාර සැපයීමට දරූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 7,114 කි. මේ අතර, 1991 අග වන විට පාරිභෝජනය සඳහා වෙන් කරන ලද මුදලින් ඇතිවූ සමුච්චිත මුළු ඉතුරුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,048 ක් විය. ජනසවිය පළමු වටය යටතේ ආදායම් උපදවන කටයුතු මගින් මුළු ජනසවි පවුල් වලින් සියයට 92 ට වැඩි ප්‍රතිශතයක් මසකට රුපියල් 1,000/- කට

වැඩි මාසික ආදායමක් උපයන ලදී. ජනසවි ලාභීන්ගෙන් වැඩි කොටසක් කෘෂි හා සත්ව පාලනය, ධීවර කටයුතු, කර්මාන්ත, වෙළඳාම සහ අනෙකුත් වෙනත් ව්‍යාපෘතිවල සේවා නියුක්ත වී ඇත.

ජනසවිලාභීන් ආදායම් වැඩිකර ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් ඵලදායී ව්‍යාපෘති සඳහා ණය පහසුකම් ද ලබාගන්නා ලදී. මේ අනුව ලංකා බැංකුව, මහජන බැංකුව, ග්‍රාමීය බැංකු හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු යන මූල්‍ය ආයතන හා අනෙකුත් මූලයන් ජනසවි පවුල් ආරම්භ කළ ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා රුපියල් දශ ලක්ෂ 655 ක් ලබා දී ඇත.

## පාසැල් - දිවා ආහාර වැඩපිළිවෙල

පාසැල් යන ළමුන්ගේ පෝෂණ තත්ත්වය වර්ධනය කර ගැනීමේ අරමුණින් 1989 වර්ෂයේ හඳුන්වා දුන් දිවා ආහාර වැඩ පිළිවෙළ යටතේ 1991 වර්ෂයේ සිසුන් 4,230,637 ක් ප්‍රතිලාභ අත්පත් කර ගත්තේය. මේ වැඩපිළිවෙළ සඳහා වූ වියදම කලින් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 1,644 සමග සසඳන විට 1991 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 1,402 ක් විය.

## සෞඛ්‍යය

1991 වර්ෂයේ සෞඛ්‍ය සේවා සඳහා වූ රජයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 5240 හෙවත් සියයට 4.4 ක් විය. මෙය කලින් වර්ෂයට සාපේක්ෂව සියයට 6 ක වැඩිවීමකි. 1991 වර්ෂයෙහිදී සෞඛ්‍ය කටයුතු සඳහා වූ වර්තන වියදම් රුපියල් දශ ලක්ෂ 4110 දක්වා සියයට 12 කින් ඉහළ ගිය අතර ප්‍රාග්ධන වියදම සියයට 12 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 1130 ක් විය.

1991 වර්ෂයේදී ඇඳන් 45,600 කින් පමණ සමන්විත වූ රජයේ රෝහල් 504 මගින් දශ ලක්ෂ 31 පමණ වූ රෝගීන්ට සෞඛ්‍ය සේවා පහසුකම් සපයන ලදී. මීට අමතරව, පෞද්ගලික අංශයද ප්‍රධාන වශයෙන් නාගරික මධ්‍යස්ථානවල පිහිටා තිබෙන රෝහල් 79 ක් මගින් සේවා සපයන ලදී.

## අධ්‍යාපනය

අධ්‍යාපනය සඳහා වූ රජයේ මුළු වියදම 1990 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 9,571 සිට, 1991 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 9,084 දක්වා අඩු විය. රජයේ වියදමට එහි දායකත්වය, 1990 වර්ෂයේ සියයට 11 ට සාපේක්ෂව බලන විට 1991 වර්ෂයේ දී සියයට 8 ක් විය. අධ්‍යාපනය සඳහා වූ වර්තන වියදම 1990 වර්ෂයේ රුපියල් දශලක්ෂ 8529 ට සාපේක්ෂව 1991 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 7,907 දක්වා, සියයට 7 කින් අඩු වූ අතර ප්‍රාග්ධන වියදම 1990 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 1042 සිට 1991 වර්ෂයේ රුපියල් දශලක්ෂ 1177 දක්වා සියයට 13 කින් වැඩි විය.

සාමාන්‍ය අධ්‍යාපනය යටතේ, වූ මුළු පාසැල් සංඛ්‍යාව 1990 වර්ෂයේ 10,382 සිට, 1991 වර්ෂයේ 10,401 දක්වා වැඩි විය. මේ අතර, මුළු ශිෂ්‍ය සංඛ්‍යාවද 1990 වර්ෂයේ 4,232,356 සිට 1991 වර්ෂයේ 4,251,704 දක්වා වැඩි විය. ඒ අනුව, පාසැල් ශිෂ්‍ය අනුපාතය 1990 වර්ෂයේ 408 සිට 1991 වර්ෂයේ 409 දක්වා සුළු වශයෙන් වැඩි විය. කෙසේ වුවද, සියළුම පාසැල්වල ගුරුවරුන්ගේ මුළු සංඛ්‍යාව 1991 වර්ෂයේ 176,173 දක්වා සියයට 5 කින් අඩු විය. ඒ අනුව, 1990 වර්ෂයේ 23 ක් වූ පාසැල්හි ගුරු-සිසු අනුපාතය 1991 වර්ෂයේදී 24 දක්වා සුළු වශයෙන් වැඩි විය.

## 1.28 සංඛ්‍යා සටහන
## සෞඛ්‍ය සේවය 1987 - 1991

| ශීර්ෂය | 1987 | 1988 | 1989 | 1990 | 1991(අ) |
|---|---|---|---|---|---|
| (1) ආරෝග්‍යශාලා (බටහිර වෛද්‍ය සේවය) (අ) | 506 | 498 | 502 | 502 | 504 |
| (2) ඇඳන් ගණන | 45,019 | 45,406 | 46,620 | 42,079* | ලැ.නො. |
| (3) මධ්‍යම බෙහෙත් ශාලා | 346 | 350 | 361 | 278* | 375 |
| (4) මුළු වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 2,354 | 2,316 | 2,456 | 2,440** | 2,963 |
| (5) මුළු සහකාර වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 1,026 | 1,100 | 1,193 | 1,074** | 1,200 |
| (6) මුළු ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 13,570 | 12,957 | 13,076 | 13,284 | 12,852 |
| (7) මුළු හෙද සේවක සංඛ්‍යාව | 7,843 | 8,317 | 9,486 | 8,957** | 10,504 |
| (8) මුළු උපස්ථායක සංඛ්‍යාව | 5,462 | 6,019 | 6,030 | 5,707** | 5,422 |
| (9) ප්‍රතිකාර ලත් අභ්‍යන්තර රෝගීන්ගේ ගණන ('000) | 2,772 | 2,543 | 2,525 | 2,533* | ලැ.නො. |
| (10) බාහිර රෝගීන්ගේ ගණන ('000) | 34,139 | 31,407 | 31,781 | 28,401* | ලැ.නො. |
| (11) මුළු ජංගම වියදම (රු. දශ ලක්ෂ) | 2,393 | 2,452 | 3,748 | 3,685 | 4,110 |
| (12) මුළු සෞඛ්‍ය වියදම (රු. දශ ලක්ෂ) | 3,710 | 3,994 | 4,625 | 4,963 | 5,240 |

(අ) තාවකාලිකයි
* උතුරු සහ නැගෙනහිර පළාත් හැර.
** උතුරු පාලන හැර.

මූලයන්: සෞඛ්‍ය හා වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## 1.29 සංඛ්‍යා සටහන

# සාමාන්‍ය අධ්‍යාපනය 1987 - 1991

| ශීර්ෂය | 1987 | 1988 | 1989 | 1990 | 1991(අ) |
|---|---|---|---|---|---|
| (1) මුළු පාසල් සංඛ්‍යාව | 10,207 | 10,261 | 10,296 | 10,382 | 10,401 |
| 1.1 රජයේ මුළු පාසල් සංඛ්‍යාව | 9,709 | 9,771 | 9,805 | 9,864 | 9,879 |
| 1.2 වෙනත් පාසල් | 498 | 490 | 491 | 518 | 522 |
| (2) මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 3,974,605 | 4,058,842 | 4,179,520 | 4,232,356 | 4,251,704 |
| 2.1 රජයේ පාසල් | 3,855,019 | 3,938,062 | 4,057,815 | 4,111,272 | 4,128,211 |
| 2.2 වෙනත් පාසල් | 119,586 | 120,781 | 121,705 | 121,084 | 123,493 |
| (3) අළුතෙන් ඇතුලත් කර ගැනීම් | 394,602 | 394,960 | 396,748 | 387,314 | 390,033 |
| (4) මුළු ගුරුවරුන්ගේ සංඛ්‍යාව | 146,712 | 146,334 | 153,243 | 184,822 | 176,173 |
| 4.1 රජයේ ගුරුවරු | 140,385 | 140,061 | 146,997 | 178,333 | 169,667 |
| 4.2 වෙනත් | 6,327 | 6,273 | 6,246 | 6,489 | 6,506 |
| (5) ශිෂ්‍ය/ගුරු අනුපාතය | 27.09 | 27.74 | 27 | 23 | 24 |
| (6) සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ මුළු වර්තන වියදම | 3,762.5 | 4,749.4 | 5,621 | 8,529 | 7,905 |
| (7) එක් ශිෂ්‍යයෙකුට වියදම (රුපියල්) | 947 | 1,170 | 1,345 | 2,015 | 1,860 |

(අ) තාවකාලිකයි.

මූලය: අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

## මහවැලි වැඩපිළිවෙල

1991 වර්ෂයේදී මහවැලි වැඩපිළිවෙල මගින් මූලික අවධානය යොමු කරන ලද්දේ කලාපවල කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු සඳහාය. විවිධ කලාප යටතේ ගොවි පවුල් පදිංචි කරවීමද වර්ෂය තුලදී නොකඩවා ක්‍රියාත්මක කෙරුණි. 1991 වර්ෂයේදී ව්‍යවසායක සංවර්ධන කටයුතු යටතේ ස්වයං රැකියා ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරන ලදී. මහවැලි වැඩපිළිවෙල යටතේ ප්‍රධාන වශයෙන් කොත්මලේ ප්‍රදේශයේ අවට ප්‍රදේශ සංවර්ධනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කෙරුණි. 1991 වර්ෂය තුල මහවැලි කඩිනම් වැඩපිළිවෙල සඳහා වැය වූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 2,456 ක් විය. එයින් ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 1,496 ක් හෙවත් සියයට 61 ක ප්‍රමාණයක් වියදම් කරන ලද්දේ කලාපඃ "බී" කලාපය (රුපියල් දශ ලක්ෂ 522) ,"සී" කලාපය (රුපියල් දශ ලක්ෂ 744 ), "ජී" කලාපය (රුපියල් දශ ලක්ෂ 35) සහ "එල්" කලාපය (රුපියල් දශ ලක්ෂ 70) සංවර්ධන වැඩ කටයුතු සඳහාය.

1991 වර්ෂය තුලදී මහවැලි වැඩපිළිවෙල යටතේ ගැනෙන ජල විදුලිබල ව්‍යාපෘතීන් හය මගින් ගිගවොට් පැය 1,529 ක විදුලිබල ප්‍රමාණයක් උත්පාදනය කරන ලදී. මෙම ප්‍රමාණය 1990 වර්ෂයේදී මහවැලි වැඩපිළිවෙල යටතේ නිෂ්පාදනය කල මුළු විදුලිබල ප්‍රමාණයට වඩා සියයට

**1.30 සංඛ්‍යා සටහන**

**මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පවුල් පදිංචි කිරීම**
**('එච්' 'සී' 'බී' 'ජී' සහ 'එල්' කලාප)**

පවුල් සංඛ්‍යාව

| ප්‍රදේශය / වර්ෂය | 'එච්' | 'සී' | 'බී' | 'ජී' | 'එල්' | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1975 .. | - | - | - | - | - | - |
| 1976 .. | 2,383 | - | - | - | - | 2,383 |
| 1977 .. | 3,141 | - | - | - | - | 3,141 |
| 1978 .. | 2,754 | - | - | - | - | 2,754 |
| 1979 .. | 5,290 | - | - | - | - | 5,290 |
| 1980 .. | 7,407 | - | - | - | - | 7,407 |
| 1981 .. | 2,389 | 2,777 | - | - | - | 5,166 |
| 1982 .. | 1,449 | 2,683 | 1,918 | - | - | 6,050 |
| 1983 .. | 1,077 | 1,988 | 1,938 | 1,319 | - | 6,322 |
| 1984 .. | 1,956 | 1,992 | 1,381 | 446 | - | 5,775 |
| 1985 .. | 44 | 823 | 3,423 | 1,045 | - | 5,335 |
| 1986 .. | 780 | 2,151 | 1,260 | 583 | - | 4,774 |
| 1987 .. | 182 | 1,407 | 857 | 274 | - | 2,720 |
| 1988 .. | 14 | 1,081 | 656 | 85 | 3,270 | 5,106 |
| 1989 .. | 9 | 1,008 | 324 | 1,305 | 94 | 2,740 |
| 1990 .. | 1,680 | 3,427 | 3,492 | 366 | - | 8,965 |
| 1991 (අ) .. | 1,151 | 3,240 | 1,468 | 126 | - | 5,985 |
| එකතුව .. | 31,706 | 22,577 | 16,717 | 5,549 | 3,364 | 79,913 |

මූලයඃ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

(අ) තාවකාලිකයි.
සටහන : 1991 ට පෙර දත්තයන් සංශෝධිතයි.

11 ක අඩු වීමකි. පසුගිය වසර සමග සසඳන කල වික්ටෝරියා (ගිගවොට් පැය 483), කොත්මලේ (ගිගවොට් පැය 348) , රන්දෙනිගල (ගිගවොට් පැය 277) සහ බෝවතැන්න (ගිගවොට් පැය

1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ලැබුණු තොරතුරු මත පදනම් වේ.

## 1.31 සංඛ්‍යා සටහන

### මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගා කළ අළුත් ඉඩම් ප්‍රමාණය

හෙක්ටයාර

| ශීර්ෂය | මහ 1987/88 | යල 1988 | එකතුව 1988 | මහ 1988/89 | යල 1989 | එකතුව 1989 | මහ 1989/90 | යල 1990 | එකතුව 1990 | මහ 1990/91 (අ) | යල 1991 (අ) | එකතුව 1991 (අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 'එච්' කලාපය | 24,847 | 12,830 | 37,677 | 19,076 | 4,137 | 23,213 | 30,539 | 18,468 | 49,007 | 31,240 | 19,846 | 51,086 |
| වී | 23,560 | 3,951 | 27,511 | 17,360 | 1,455 | 18,815 | 27,882 | 7,594 | 35,476 | 29,392 | 9,176 | 38,568 |
| අනෙකුත් බෝග | 1,287 | 8,879 | 10,166 | 1,716 | 2,682 | 4,398 | 2,657 | 10,874 | 13,531 | 1,848 | 10,670 | 12,518 |
| 'බී' කලාපය | 8,649 | 6,413 | 15,062 | 9,014 | 9,306 | 18,320 | 10,738 | 10,567 | 21,305 | 11,694 | 10,288 | 21,982 |
| වී | 8,258 | 5,945 | 14,203 | 8,688 | 8,669 | 17,357 | 10,207 | 9,721 | 19,928 | 10,912 | 9,678 | 20,590 |
| අනෙකුත් බෝග | 391 | 468 | 859 | 326 | 637 | 963 | 531 | 846 | 1,377 | 782 | 610 | 1,392 |
| 'සී' කලාපය | 13,362 | 11,219 | 24,581 | 13,105 | 12,768 | 25,873 | 17,329 | 14,730 | 32,059 | 19,026 | 15,751 | 34,777 |
| වී | 11,618 | 11,155 | 22,773 | 11,565 | 12,409 | 23,974 | 14,085 | 14,274 | 28,359 | 15,632 | 15,008 | 30,640 |
| අනෙකුත් බෝග | 1,744 | 64 | 1,808 | 1,540 | 359 | 1,899 | 3,244 | 456 | 3,700 | 3,394 | 743 | 4,137 |
| 'ජී' කලාපය | 4,243 | 3,613 | 7,856 | 4,381 | 3,825 | 8,206 | 4,834 | 4,601 | 9,435 | 5,100 | 4,845 | 9,945 |
| වී | 3,830 | 1,740 | 5,570 | 4,104 | 1,842 | 5,946 | 4,546 | 2,702 | 7,248 | 5,017 | 2,563 | 7,580 |
| අනෙකුත් බෝග | 413 | 1,873 | 2,286 | 277 | 1,983 | 2,260 | 288 | 1,899 | 2,187 | 83 | 2,282 | 2,365 |
| 'එල්' කලාපය | - | - | - | - | - | - | 514 | 453 | 967 | 1,080 | 164 | 1,244 |
| වී | - | - | - | - | - | - | 315 | 137 | 452 | 700 | 84 | 784 |
| අනෙකුත් බෝග | - | - | - | - | - | - | 199 | 316 | 515 | 380 | 80 | 460 |
| එකතුව | 51,101 | 34,075 | 85,176 | 45,576 | 30,036 | 75,612 | 63,954 | 48,819 | 112,773 | 68,140 | 50,894 | 119,034 |

(අ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

57) ජල විදුලිබල ව්‍යාපෘතීන් හි උත්පාදනය කළ විදුලිබල ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 21 කින්, සියයට 17 කින්, සියයට 17 කින් සහ සියයට 25 කින් පහත වැටුනි. එයට වෙනස්ව යමින්, රන්ටැඹේ (ගිගවොට් පැය 170) සහ උකුවෙල(ගිගවොට් පැය 194) ව්‍යාපෘතීන් උත්පාදනය කළ ජල විදුලි ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 73 ක සහ සියයට 7 ක වර්ධනයක් පෙන්වන ලදී. 1990 වසරේ මැද භාගයේදී ආරම්භ කරන ලද රන්ටැඹේ විදුලිබල ව්‍යාපෘතිය ජල විදුලිබල උත්පාදනය කෙරුණු ප්‍රමාණය සැළකිය යුතු ලෙස වැඩි වෙමින් එහි කටයුතු වසර පුරාම ක්‍රියාත්මක විනි. 1991 වර්ෂය තුලදී මහවැලි වැඩපිළිවෙල තුලින් උත්පාදනය කරන ලද මුළු විදුලිබල ප්‍රමාණය ජාතික විදුලිබල සැපයුමෙන් සියයට 45 ක ප්‍රමාණයකට දායක විය.

මහවැලි අධිකාරිය විසින් සපයනු ලැබූ තාවකාලික දත්තයන්ට අනුව, මහවැලි බල ප්‍රදේශය තුල වගාකරන ලද මුළු බිම් ප්‍රමාණය 1991 වසරේදී හෙක්ටයාර 119,034 දක්වා සියයට 6 කින් වැඩිවිය. 1989/90 මහ කන්නයේදී සියයට 40 ක වැඩිවීමක් පෙන්වූ මහවැලි බලප්‍රදේශය තුල වගාකරන ලද බිම් ප්‍රමාණය 1990/91 මහ කන්නය තුලදී මෙය තවදුරටත් සියයට 7 කින් ඉහළ නගිමින් හෙක්ටයාර 68,140 ක් විය. සැලකිය යුතු ලෙස සියයට 63 කින් වැඩි වූ 1990 යල කන්නයේදී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය 1991 දී හෙක්ටයාර 50,894 දක්වා තවදුරටත් සියයට 4 ක වර්ධනයක් වාර්තා කරන ලදී.

1990 වර්ෂයේදී මහවැලි බල ප්‍රදේශය තුල වී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය සියයට 38 කින් වැඩිවූ අතර, 1991 වර්ෂයේදී එම බිම් ප්‍රමාණය තවදුරටත් සියයට 7 කින් වැඩිවී හෙක්ටයාර 98,162 ක් විය. කෙසේ වුවද, පසුගිය වර්ෂයෙහි දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩිවීමක් පෙන්නුම් කළ වෙනත් බෝග වගා කළ බිම් ප්‍රමාණය 1991 වර්ෂය තුලදී සියයට 2 ක අඩුවීමක් දක්වමින් හෙක්ටයාර 20,872 කට සීමා විය.

පසුගිය වර්ෂයේ මහවැලි වැඩපිළිවෙල යටතේ ගැනෙන කලාපයන්හි පදිංචි කළ පවුල් සංඛ්‍යාව සමග සසඳන කල, 1991 වර්ෂයේදී පදිංචි කරවූ මුළු පවුල් සංඛ්‍යාව 5,985 දක්වා සියයට 33 කින් අඩු විය. මෙයින් පවුල් 3,240 ක් හෙවත් සියයට 54 ක් "සී" කලාපයෙහි පදිංචි කරවන ලදී. වර්ෂය තුල "බී" සහ "එච්" යන කලාපවල පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව පිළිවෙලින් 1,468 ක් සහ 1,151 ක් විය. එහෙත් "එල්" කලාපයේ 1991වර්ෂයේදී පවුල් පදිංචි කරවීමක් සිදු නොවීය.

## වෙනත් වාරිමාර්ග සංවර්ධනය

පසුගිය වර්ෂයේ මෙන් 1991 වර්ෂයේදීද දැනට පවතින ප්‍රධාන සහ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම එලෙසම නොකඩවා පවත්වාගෙන යනු ලැබිණි. වෙනත් වාරිමාර්ග සංවර්ධන වැඩ කටයුතු දැනට පවත්නා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි පුනරුත්ථාපන නඩත්තු සහ කළමනාකරණ, කුඩා වැව් ඇතුළු සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි ප්‍රතිසංස්කරණයන් සහ නගාසිටුවීම් මෙන්ම, ගංවතුර වැලැක්වීමේ කටයුතු වලින් සමන්විත වේ. මහවැලි වැඩපිළිවෙල මගින් ආවරණය වන ප්‍රදේශ හැර අනෙකුත් සියළුම ප්‍රදේශවල ඒකාබද්ධ වාරිමාර්ග ක්‍රම කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ගොවීන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ඇති කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී.

සියළුම ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවල වැඩකටයුතු, එනම් කිරිඳිඔය වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘතියේ පළමු සහ දෙවන අදියර, නිල්වලා ගඟ ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය, ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය, මිනිපේ-නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සහ වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය, 1991 වර්ෂය තුලදී නොකඩවා ක්‍රියාත්මක විය. මෙම වාරිමාර්ග ව්‍යාපෘතීන් වෙනුවෙන් 1990 වර්ෂයේදී වැය කරන ලද මුළු මුදල වන රුපියල් දශ ලක්ෂ 291 සමග සසඳන විට 1991 වර්ෂයේදී දැරූ වියදම රුපියල් දශ ලක්ෂ 382 ක් විය. මෙම වර්ෂය තුලදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවල වාරිමාර්ග ජලයෙන් කෙරෙන කෘෂිකාර්මික කටයුතු සහ ජල කළමනාකරණය සඳහා ඉඩම් සහ ජල සම්පත් සංවර්ධන කටයුතුවල සැළකිය යුතු වර්ධනයක් වාර්තා විය.

## 1.32 සංඛ්‍යා සටහන

### තෝරා ගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වූ වියදම

| ව්‍යාපෘතිය | ආධාර ලබා ගත් මූලාශ්‍රය | මුළු විදේශ විනිමය ලැබීම් (දශ ලක්ෂ) | 1990 වියදම(රු. දශ ලක්ෂ) | 1991 (අ) වියදම(රු. දශ ලක්ෂ) | 1991 (අ) අවසානය දක්වා සමුච්චිත වියදම (රු. දශ ලක්ෂ) |
|---|---|---|---|---|---|
| 1. කිරිදිඹය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය - පියවර I .. | ඒ.ඩී.බී.<br>කේ.එෆ්.ඩබ්.<br>අයි.එෆ්.ඒ.ඩී.<br>අයි.එෆ්.ඒ.ඩී. | ඇ.එ.ජ.ඩො. 30.0<br>ඩොයිෂ් මාර්ක් 43.5<br>එස්.ඩී.ආර්. 5.5<br>ඇ.එ.ජ.ඩො. 12.0 | 14.0 | 116.0 | 1,813.0 |
| 2. කිරිදිඹය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය - පියවර II .. | ඒ.ඩී.බී. | එස්.ඩී.ආර්. 22.2 | 112.0 | 85.0 | 385.0 |
| 3. ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය .. | අයි.ඩී.ඒ. | එස්.ඩී.ආර්. 24.4 | 115.8 | 40.0 | 967.0 |
| 4. තිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය - අදියර II .. | ප්‍රංශය | ෆ්‍රෑන්ක් 200.0 | 16.2 | 81.7 | 238.9 |
| 5. මිනිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය .. | ජපානය | යෙන් 1,295.0 | 19.0 | 15.9 | 36.7 |
| 6. වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය .. | – | – | 14.4 | 43.0 | 57.4 |

(අ) තාවකාලිකයි.

මූලය: වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

කිරිදිඹය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියෙහි පළමුවන පියවරෙන් 1991 වසර සඳහා දේශීය ජල සම්පාදන යෝජනා ක්‍රමයෙහි පළමු පියවර නිමකිරීමට අපේක්ෂා කරනු ලැබුවද, ඉලක්කගත ප්‍රමාණය වූ සියයට 77 සමග සසඳන කල වසර තුළදී එයින් සියයට 58 ක කොටසක් පමණක් සම්පූර්ණ කරන ලදී. 1991 වසර සඳහා වෙන් කළ මුදලින් සියයට 97 ක් උපයෝගී කර ගනිමින් මෙම ව්‍යාපෘතිය සඳහා දැරූ වියදම රුපියල් දශ ලක්ෂ 116 ක් විය. මෙම යෝජනා ක්‍රමයෙහි දෙවන පියවර යටතේ රුපියල් දශ ලක්ෂ 85 ක මුදලක් වැය කරමින්, 1991 වර්ෂයෙහිදී වාරි ජලය සැපයිය හැකි අළුත් ඉඩම් ආසන්න වශයෙන් හෙක්ටයාර 120 ක ප්‍රමාණයක් සංවර්ධනය කරන ලදී

තිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියේ දෙවෙනි අදියරයෙහි ඉතිරි වැඩ කොටසින් සියයට 50 ක් නිම කිරීමට 1991 වර්ෂයේදී සැළසුම් කරන ලදී. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතියෙහි 1991 වසරට සැළසුම් කළ වැඩ කොටසින් සියයට 30 ක් පමණක් වසර තුලදී සම්පූර්ණ කළ අතර, ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 9.6 ක් වැය කරන ලදී.

1991 වර්ෂයේදී ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති යටතේ රුපියල් දශ ලක්ෂ 40 ක වියදමක් දරමින් දිස්ත්‍රික්ක 10 ක සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම 44 ක ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදී. මිනිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ වැය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 16 ක් විය.

පසුගිය වර්ෂයේ මෙන් ප්‍රතිපත්ති සැළසුම් සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ ගැනෙන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයන්හි වාරිමාර්ග වැඩකටයුතුවල ඉදි කිරීම් කාර්යයන් 1991 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් හම්බන්තොට, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කුවල නොකඩවා ක්‍රියාත්මක කරන ලදී.

1991 වර්ෂයේදී සුළු වාරිමාර්ගවල ඉදි කිරීම් කටයුතු සඳහා අරමුදල් විමධ්‍යගත අයවැයෙන් සපයන ලදී. 1990 වර්ෂයේදී ආරම්භ කරන ලද, වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය, 1991 වර්ෂයෙහි සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. මේ ව්‍යාපෘතිය යටතේ ආවරණය වූ ව්‍යාපෘති 10 න් ව්‍යාපෘති 3 ක වැඩ කටයුතු 1991 දී නිම කරන ලදී. මෙමගින් අළුත් ඉඩම් හෙක්ටයාර 1,240 සහ දැනට පවත්නා ඉඩම් හෙක්ටයාර 1,177 කට වාරිමාර්ග ජලය සපයනු ලබයි.

1991 වසරෙහිදීද ඒකාබද්ධ වාරිමාර්ග ක්‍රම කළමනාකරණ යෝජනා ක්‍රමයට අදාළ කාර්යයන් නොකඩවා ක්‍රියාත්මක කෙරුණි. උක්ත යෝජනා ක්‍රමය යටතේ බෙදුම් ඇල ගොවි සංවිධාන සහ කෙත් ඇල ගොවි සංවිධාන පිළිවෙලින් 16 ක් සහ 75 ක් පිහිටුවන ලදී.

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල මධ්‍යම මට්ටමෙහි කාර්යක්ෂම සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් විමධ්‍යගත සංවර්ධන කටයුතු මගින් ග්‍රාමීය ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කරලීමෙහි නිරත වන ලදී.

පසුගිය වසරෙහි මෙන්, 1991 වර්ෂයෙහිදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලට දිස්ත්‍රික්ක 12 ක් ඇතුළත් විය. ලෝක බැංකු ආධාර සහිතව 1981 වර්ෂයේදී ආරම්භ වූ පුත්තලම් දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල 1991 වසරේදී අවසන් කරන ලදී. ආසියානු සංවර්ධන බැංකු ආධාර සහිතව දකුණු පළාත් සඳහා නව ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලක් 1991 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන වශයෙන් ගාල්ල දිස්ත්‍රික්කය සහ දකුණු පළාතේ වෙනත් දිස්ත්‍රික්ක දෙකක ග්‍රාමීය සංවර්ධන වැඩ කටයුතු ඇතුළත් වේ. ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනයේ (සීඩා) සහය ඇතිව ක්‍රියාත්මක කෙරෙන අනුරාධපුර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙළෙහි ව්‍යාපෘති සූදානම් කිරීමේ කාර්යයන් කිරීම

## 1.33 සංඛ්‍යා සටහන
## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල - දිස්ත්‍රික්ක අනුව වියදම
## 1990 - 1991

රුපියල් දශ ලක්ෂ

| දිස්ත්‍රික්කය(අ) | විදේශාධාර මූලාශ්‍රය | ගණන් බලන ලද වියදම - විදේශීය | ගණන් බලන ලද වියදම - දේශීය | ගණන් බලන ලද වියදම - එකතුව | සමුච්චිත වියදම - 1990 වර්ෂය අවසානය දක්වා | සමුච්චිත වියදම - 1991 වර්ෂය අවසානය දක්වා (ආ) | වියදම - 1990 වර්ෂය තුළදී | වියදම - 1991 වර්ෂය තුළදී (ආ) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. මාතර (1979) | සීඩා (ස්වීඩනය) | 338 | 37 | 375 | 243 | 308 | 43 | 65 |
| 2. හම්බන්තොට (1979) | නෝරාඩ් (නෝර්වේ) | 686 | 14 | 700 | 576 | 684 | 76 | 108 |
| 3. නුවරඑළිය (1979) | නෙදර්ලන්තය | 510 | 10 | 520 | 349 | 391 | 37 | 42 |
| 4. මාතලේ (1981) | ජා. සං. නි. | 337 | 131 | 468 | 439 | 445 | 19 | 6 |
| 5. බදුල්ල (1981) | කෘෂි. සං. ජා. අරමුදල සීඩා | 500 | 110 | 610 | 377 | 447 | 50 | 70 |
| 6. රත්නපුරය (1984) | නෙදර්ලන්තය | 209 | 4 | 213 | 158 | 197 | 28 | 39 |
| 7 මොණරාගල (1984) | නෝරාඩ් (නෝර්වේ) | 413 | 8 | 421 | 238 | 300 | 56 | 62 |
| 8. කෑගල්ල (1986) | කෘෂි. සං. ජා. අරමුදල | 262 | 147 | 409 | 169 | 253 | 60 | 84 |
| 9. කළුතර (1987) | ෆිනිඩා (ෆින්ලන්තය) | 371 | 66 | 437 | 245 | 316 | 52 | 71 |
| 10. මහනුවර (1987) | ජර්මනිය | 120 | 5 | 125 | 20 | 30 | 6 | 10 |
| 11. ගම්පහ (1989) | ජපානය | 521 | 38 | 559 | 260 | 511 | 259 | 251 |
| 12. එස්. පී. ආර්. ඩී. පී. (1991) (ඇ) | ආසියානු සංවර්ධන බැංකුව | 1520 | 400 | 1920 | - | 11 | - | 11 |

(අ) ක්‍රියාත්මක කරන ලද වර්ෂය වරහන් තුළින් දැක්වේ.
(ආ) තාවකාලිකයි.
(ඇ) එස්. පී. ආර්. ඩී. පී-දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය.

මූලය: ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.

1991 දී ක්‍රියාත්මක කරණු ලැබිණි.

1990 වර්ෂයෙහිදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල සඳහා වැය වූ රුපියල් දශ ලක්ෂ 694 සමග සැසඳීමේදී, 1991 දී මෙම වැඩපිළිවෙලට වැය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 820 ක් විය. 1990 සහ 1991 වර්ෂයන් තුලදී කරන ලද මුළු වියදම සමඟ 1991 වසර අවසානය දක්වා වූ සියළුම ව්‍යාපෘතිවල සමුච්චිත වියදම 1.33 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.